# සී/ස ලංකා නැව් සංස්ථාව

## (වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය)

# ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා පවතින ඇබෑර්තුව පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1) සාමාන්‍යාධිකාරී තනතුර - HM 2-3 (ඇබෑර්තු 01)

➢ **සුදුසුකම්** :

**බාහිර අපේක්ෂකයින්** :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / අලෙවි කළමනාකරණය / වාණිජ්‍ය / ඉංජිනේරු / විද්‍යාව හෝ ගණිතය පිළිබඳ උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් තිබීම හෝ නාවික ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් ආයතනික සාමාජිකත්වය ලබා තිබීම

සහ

පළමු උපාධිය ලබාගැනීමෙන් අනතුරුව නාවික ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක පිළිගත් සංස්ථාවක, මණ්ඩලයක හෝ වෙළඳ ආයතනයක අවම වශයෙන් අවුරුදු 18 ක සනාථ කළ හැකි පළපුරුද්ද හා ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද තිබිය යුතුය.

➢ **අභ්‍යන්තර අපේක්ෂකයින්** :

සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාර තනතුරේ (HM 2-2 කාණ්ඩයේ) අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද තිබීම.

➢ **වැටුප් පරිමාණය** : HM 2-3 - 2016: රු. (98,215 - 12 x 2700 - 130,615)

සංශෝධිත වැටුප අනුව, තෝරාගනු ලබන අපේක්ෂකයා HM 2-3 වැටුප් පරිමාණයේ මූලික වැටුප රු. 98,215 /- වැටුපෙහි පිහිටවනු ලැබේ.

මෙම වැටුපට අමතරව රජය සතු ව්‍යවසායන් සඳහා ගෙවනු ලබන සියළුම අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.

➢ **වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට සහ රාජ්‍ය අංශයේ ඉල්ලුම් කරුවන්ට අදාළ නොවේ.

➢ **බඳවාගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

➢ **ප්‍රතිලාභ** :

1. සේ.අ.අ. / සේ.නි.භා.අ.
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිත නොකළ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා / උත්සව ණය අදාළ පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ අනෙකුත් සේවක මණ්ඩල ණය
7. සහනශීලී වාහන ණය
8. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05/2017 අනුව වෘත්තීය දීමනාව
9. PED චක්‍රලේඛ අංක 01/2015 (i) අනුව ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

**පොදු උපදෙස්**

- සියලුම අයදුම්පත් තමා විසින් සත්‍ය බවට සහතික කළ අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සඳහා සහතිකපත්වල පිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් **2021 මාර්තු 20 වන දින හෝ ඊට ප්‍රථම, සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, අංක. 27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** ලිපිනයට හෝ **hr@cscl.lk** යන විද්‍යුත් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

සභාපති

**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**

**අංක. 27, MICH ගොඩනැගිල්ල**

**ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය), කොළඹ 01**

**වැඩි විස්තර සඳහා 071-445 2898 - මානව සම්පත් අංශය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව**